**කොළඹ විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව**

**නීති පීඨය**

**නීතිවේදී (ගෞරව) උපාධි පරීක්ෂණය, පළමු වසර**

**පළමු සෙමෙස්තර අවසාන පරීක්ෂණය - 2023**

**LAW 11303 - නීති පද්ධති**

(පැ දෙකයි මිනිත්තු 15යි)

මුළු ප්‍රශ්න සංඛ්‍යාව : **04**

ඕනෑම ප්‍රශ්න <u>දෙකකට **(02)**</u> පමණක් පිළිතුරු සපයන්න.

(අපැහැදිලි අත්අකුරු සඳහා ලකුණු අඩු කෙරේ.)

---

1. “බ්‍රිතාන්‍ය පාලන සමයේදී ව්‍යවස්ථා මගින් පැහැදිලිව හඳුන්වා දුන් අවස්ථාවලදී ඉංග්‍රීසි නීතිය අදාළ කළ අතර නීතියේ හිඩැසක් තිබූ තැන්වලදී රෝම ලන්දේසි නීතිය රටේ ශේෂ්‍ය නීතිය ලෙස යොදන ලදී. කෙසේ වෙතත්, ශ්‍රී ලංකාවේ අධිකරණ තීන්දු වලදී රෝම-ලන්දේසි නීතිය සහ ඉංග්‍රීසි නීතියේ යෙදීම මතභේදාත්මක වූ අතර නිරන්තර නීති ගැටුමකට හේතු වී තිබේ.”

ඉහත ප්‍රකාශය විනිශ්චිත නඩු තීන්දු තුනක් සලකා බලමින් සාකච්ඡා කරන්න.

(ලකුණු 30)

2. (අ)ශ්‍රී ලංකාවේ මුස්ලිම් නීතියේ මූලික මූලාශ්‍ර මොනවාද? මුස්ලිම් ප්‍රජාව තුළ පුද්ගලික තත්වය සහ ආගමික පරිචයන්ට අදාළ කරුණු සම්බන්ධයෙන් වන නීතිමය රාමුවට සහ තීරණ ගැනීමේ ක්‍රියාවලියට එම මූලාශ්‍ර බලපාන ආකාරය පැහැදිලි කරන්න.

(ආ)ඉහත (අ) කොටසේ සඳහන් මූලාශ්‍රවල වැදගත්කම සහ ධූරාවලියක් තිබේ නම්, ඒවායේ අර්ථ නිරූපණය සහ ඉස්ලාමීය මූලධර්ම භාවිතය හැඩගැස්වීමේ දී ඒවායේ භූමිකාව හදාවඩා ගත් මුස්ලිම් දරුවෙකුගේ අනුප්‍රාප්තික අයිතිවාසිකම් පිළිබඳව විශේෂ අවධානය යොමු කරමින් සාකච්ඡා කරන්න.

(ලකුණු 15x2=30)

3. තරු සහ වරුණ විවාහ වී ඔවුන්ගේ පුතුන් දෙදෙනා සමඟ පේරාදෙණියේ පදිංචිව සිටිති. වරුණ මාතර ප්‍රදේශයෙන් පැවත එන අතර , තරු පේරාදෙණියේය. වරුණගේ දෙමාපියන්ද මාතර ප්‍රදේශයේ පදිංචි කරුවන් වන අතර, තරුගේ දෙමාපියන් පේරාදෙණියේය. ඔවුන් 2001 දී මුණගැසුණු අතර 2002 දී ඔවුන්ගේ

විවාහය මහනුවරදී ලියාපදිංචි කරන ලදී. තරුගේ පියා ඇයට විවාහ දිනයේ දී අලුතින් ඉදිකරන ලද නිවසක් තෑගි කළේය. කෙසේ වෙතත්, 2008 දී, තරුගේ පියා මිය ගිය අතර, ඇගේ මව ඔවුන්ගේ පවුලේ නිවසේ තනි විය. ඛේදජනක ලෙස, තරුගේ මව මෑතකදී රිය අනතුරකින් මිය ගිය අතර, පේරාදෙණියේ පිහිටි නිශ්චල දේපල (තරුගේ දෙමාපියන්ගේ නිවස) ඉතිරි විය. තරු ගේ සහෝදරයන් දෙදෙනා තම දෙමාපියන්ගේ නිවසට තනි අයිතියක් ඉල්ලා සිටින අතර, තරුට දීග විවාහයේදී තෑග්ගක් ලෙස තම පියාගෙන් ඇගේ කොටස දැනටමත් ලැබී ඇති බව ප්‍රකාශ කරයි.

ඉහත සඳහන් කළ තත්ත්වයන් සැලකිල්ලට ගනිමින්, අදාළ නීතිමය ප්‍රතිපාදන සහ විනිශ්චිත තීරණ ඇසුරින් පහත ප්‍රශ්න වෙත පිළිතුරු සැපයීම කළ යුතුය.

(අ). ඔවුන්ගේ විවාහය උඩරට විවාහයක් ලෙස සැලකිය හැකිද? අදාළ නෛතික අධිකාරීන් භාවිතයෙන් ඔබේ පිළිතුර සඳහා හේතු දක්වන්න. තරු තමන්ගේ විවාහය මහනුවර ලියාපදිංචි කිරීමේදී බින්න විවාහයක් ලෙස සඳහන් කළා නම් පිළිතුර වෙනස් වේද? පැහැදිලි කරන්න.

(ආ). වරුණද පේරාදෙණියේ යැයි උපකල්පනය කරන්න සහ විවාහයෙන් පසු තරු සහ වරුණ කොළඹ ජීවත් වීමට තීරණය කළහ. ඔවුන්ට උඩරට නීතිය අදාළ වේද නැද්ද යන්න පැහැදිලි කරන්න.

(ලකුණු 15x2=30)

04. (අ) සහ (ආ) කොටස් දෙකටම පිළිතුරු සපයන්න.

(අ) සුන්දරම් උපත ලැබුවේ යාපනයේ චාවකච්චේරියේදී ඉන්දියානු සම්භවයක් ඇති දෙමළ දෙමාපියන්ට දාව ය. ඔහුගේ දෙමව්පියන් ඉන්දියාවේ මලබාර් ප්‍රදේශයෙන් යාපනයට සංක්‍රමණය වූ අතර ඔවුන් එහිදී හැදී වැඩී එහි ස්ථිර පදිංචිය ලබා ගත්හ. සුන්දරම් චාවකච්චේරි දෙමළ විද්‍යාලයෙන් සිය පාසල් අධ්‍යාපනය සම්පූර්ණ කර නීතිය හැදෑරීමට කොළඹ විශ්වවිද්‍යාලයේ නීති පීඨයට ඇතුළත්විය. එහිදී ඔහු මාතර දිස්ත්‍රික්කයේ නයනා නමැති තරුණිය සමඟ ප්‍රේම සම්බන්ධයක් ආරම්භ කළේය. උපාධිය සම්පූර්ණ කිරීමෙන් පසු ඔවුන් හින්දු චාරිත්‍රානුකූලව යාපනයේදී විවාහ විය. කොළඹ මූල්‍ය සමාගමක නීති නිලධාරීන් ලෙස සේවය කිරීමට වැල්ලවත්ත ප්‍රදේශයේ නිවසක් කුලියට ගත් නමුත් ඔවුහු සෑම මසකම චාවකච්චේරියේ සුන්දරම්ගේ දෙමාපියන් බැලීමට ගියහ. සුන්දරම් තම ගමේ සුබසාධක සංගමයේ උප සභාපතිවරයා වූ අතර ගමේ පොදු සුබසාධනයට දායක විය. විවාහ වී වසර පහකට පසු සුන්දරම් හදිසි අනතුරකින් මිය ගියේය. සුන්දරම්ගේ දේපළ අනුප්‍රාප්තියට තේසවලමයි නීතිය අදාළද යන්න පිළිබඳව නයනා ඔබේ උපදෙස් පතයි.

නයනාට උපදෙස් දෙන්න. අදාළ නීති අධිකාරීන් ඇසුරින් ඔබේ පිළිතුර සනාථ කරන්න.

(ආ) ''තේසවලමයි නීතිය ප්‍රදේශික සීමාවන් සහිත පුද්ගලික නීතියකි.''

ඔබ එකඟ වන්නෙහිද? අදාළ නෛතික බලධාරීන් ඇසුරින් ඔබේ පිළිතුර සනාථ කරන්න.

(ලකුණු 15x2 =30)